ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය

නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව

නීතිවේදී උපාධි පාඨමාලාව - 2023/2024

4 වන මට්ටම

අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය I

LLU4707 - පවුල් නීතිය

කාලය පැය (01) එකයි

---

දිනය - 2024 නොවැම්බර් 06 වේලාව - පෙ.ව. 9.30 – 10.30

---

අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

ප්‍රශ්න ගණන **02** යි.

<u>**එක් (01) ප්‍රශ්නයකට**</u> පමණක් පිළිතුරු සපයන්න.

1. තේසවලමෙයි නීතියෙන් පාලනය වන විසි හත් හැවිරිදි (27) අරුන් සහ විසි පස් හැවිරිදි (25) මේරි 2022 වසරේ මැයි මාසයේ සිට ස්වාමි පුරුෂයා සහ භාර්යාව වශයෙන් එකට ජීවත් වෙති. ඔවුන් එකට ජීවත් වීම ආරම්භ කිරීමට පෙර සිය එක් වීම ලියාපදිංචි කිරීම හෝ චාරිත්‍ර වාරිත්‍ර පැවැත්වීමක් සිදු නොකළ නමුත් ඔවුන්ගේ ඥාතීන් සහ මිතුරන් ඔවුන්ව විවාහක යුවළක් වශයෙන් හඳුනාගෙන තිබෙයි. 2023 වසරේ නොවැම්බර් මාසයේ දී අරුන් දහසය හැවිරිදි (16) ශාන්තිනි සමඟ ආදර සම්බන්ධතාවයක් ආරම්භ කළේ ය. ඉන් පසු ශාන්තිනිව විවාහ කර ගැනීමට අරුන් තීරණය කළ අතර ඒ සඳහා ඇයගේ දෙමව්පියන්ගේ කැමැත්ත ඉල්ලා සිටියේය. මේරි සහ අරුන්ගේ සම්බන්ධය පිළිබඳ නොදැන සිටි ශාන්තිනිගේ දෙමව්පියෝ විවාහය සඳහා ඔවුන්ගේ කැමැත්ත ප්‍රකාශ කළහ. ශාන්තිනිගේ දෙමව්පියන් අරුන් සහ ශාන්තිනිගේ විවාහය උත්කර්ෂවත් චාරිත්‍රානුකූල විවාහ මංගල්‍යයක් ලෙස 2024 දෙසැම්බර් මාසයේ පැවැත්වීමට සැලසුම් කිරීමට පටන් ගත්හ. කෙසේ වුවද අරුන් ශාන්තිනිව විවාහ කර ගැනීමට සැලසුම් කර ඇති බව 2024 ඔක්තෝබර් මාසයේ දී මේරි දැනගත් අතර තමා අරුන් සමඟ නීත්‍යානුකූලව විවාහ වී සිටින බව පවසමින් ඇය එම විවාහයට විරුද්ධ විය.

   ඉහත සිදුවීම සලකා බලමින් පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

අ) මේරි සහ අරුන් අතර නීත්‍යානුකූල වලංගු විවාහයක් පවතී ද? ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සහ අදාළ නඩු තීන්දු ආශ්‍රයෙන් ඔබේ පිළිතුර තහවුරු කරන්න.

**(ලකුණු 06)**

ආ) අරුන් සහ ශාන්තිනි අතර සිදු කිරීමට අපේක්ෂිත විවාහයේ නීත්‍යානුකූල වලංගුභාවය සාකච්ඡා කරන්න.

**(ලකුණු 06)**

ඇ) සියලු පාර්ශවයන් මුස්ලිම් නීතියෙන් පාලනය වන්නේ නම් ඉහත (අ) සහ (ආ) හි ඔබේ පිළිතුර වෙනස් වන්නේ ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.

**(ලකුණු 08)**

2. පහත නඩු තීන්දු අතරින් හතරක් තෝරා ගෙන සටහන් ලියන්න.

සෑම නඩුවකම තීන්දුව තුළ විශ්ලේෂණය කරන ලද සෙසු වැදගත් නඩු තීරණ ද ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන ද ඔබේ සටහනේ අන්තර්ගත විය යුතුය.

(අ) *අබේසුන්දර එ. අබේසුන්දර [1998] 1 Sri L.R. 185*
(ආ) *ගුණරත්නම් එ. රෙජිස්ට්‍රාර් ජෙනරාල් [2002] 2 Sri L.R. 302*
(ඇ) *කනකරත්න එ. කනකරත්න [1968] 71 NLR 522*
(ඈ) *ගෆූර් එ. විල්සන් සහ තවත් අය [1990] 1 Sri L.R. 142*
(ඉ) *ශ්‍රාමියා කැතරින් එ. විජේගුණවර්ධන [1986] 2 Sri L.R. 190* – (ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීරණය)

**(ලකුණු 05 X 04 = 20)**

*****සියලුම හිමිකම් ඇවිරිණි.*****